**ශීර්ෂය 236 - රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව**

**------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 මැයි 12 ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජුනි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම

**----------------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී /ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී /ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

**ආදායම් නොවන ලැබීම්**

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙනත් දෙපාර්තමේන්තු වෙනුවෙන් ලැබීම්වල වටිනාකම රු.21,097,417 ක් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි දක්වා නොතිබීමෙන් ආදායම් නොවන ලැබීම්වල වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. තවද, එම වටිනාකම වැරදි ලෙස අක්මුදල් ගැලපුම් ගිණුමට බැරකර තිබුණි. | වෙනත් ලැබීම් ලෙස හඳුනා ගෙන ඇති වටිනාකම් තුළ ඇත්තේ 2002,2003,2004 හා 2006 යන ආදායම් ශීර්ෂ වලට ලැබී ඇති ආදායම් වේ.ඒවා රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2020 – 7 (ii) වගන්තිය ප්‍රකාර එම ආදායම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ඇතුළත් කර නොමැති බව සඳහන් කරමි. එබැවින් එවැනි ආදායම් හා වියදම් සඳහා ගැලපීම් සිදු කරන අක්මුදල් ගැලපීම් ගිණුම තුළ ඇතුළත් කර ඇත. | චක්‍රලේඛ උපදෙස් නිසි පරිදි ක්‍රියාත්මක කල යුතු වීම. |

**1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය තුළදී අපහරණය කරන ලද මූල්‍ය නොවන වත්කම්වල පිරිවැය වටිනාකම වූ රු. 758,203 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දේපළ පිරියත හා උපකරණවලට හා සංචිත ගිණුමට ගලපා නොතිබීමෙන් එම ප්‍රමාණයෙන් වත්කම් හා සංචිත වැඩියෙන් දැක්වා තිබුණි. | එම වත්කම් වටිනාකම 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළින් ගලපා ඉවත් කිරිමට කටයුතු කරන බව සඳහන් කරමි. | වත්කම් අපහරණය කරනා ලද වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දේපල පිරියත උපකරණවල හා සංචිත ගිණුමට ගැළපිය යුතු වීම. |

| | | |
|---|---|---|
| (ආ) ජාතික ඒකාබද්ධතා හා රාජ්‍ය භාෂා සමාජ ප්‍රගති හා හින්දු ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදනවලින් මිලදීගෙන තිබූ රු. 3,514,800 ක් වටිනා වත්කම් ජ'නල් සටහන් මඟින් මාරු කරගෙන දේපළ, පිරියත හා උපකරණ ගිණුමෙහි හා සංචිත ගිණුමෙහි ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | වෙනත් අමාත්‍යාංශ වැය විෂයන්ගෙන් මිලදී ගත් වත්කම් සිගාස් පද්ධතිය තුළ ඉන්වෙන්ට්‍රිගත කිරීමේ පහසුකම සැලසී නොතිබුණු අතර ඒවා ගිණුම්ගත කිරීම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමඟ දැනටමත් සාකච්ඡා කරමින් සිටී. | අමාත්‍යාංශයක් විසින් ලබා දුන් වත්කම්, ජ'නල් සටහන් මඟින් මාරුකර ගෙන දේපල පිරියත හා උපකරණ ගිණුමේ දැක්විය යුතු වීම. |

**1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

----------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ භෞතික වත්කම් අත්පත්කර ගැනීම්වල වටිනාකම රු. 1,030,899 ක් වුවද, එයට මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීමේ හා හැකියා වර්ධනය සඳහා වූ රු.2,381,388 ක් වියදම එකතු කර රු.3,412,287 ක් ලෙස දැක්වීමෙන් එම වටිනාකම රු. 2,381,388ක් වැඩියෙන් දක්වා තිබුණි. | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දක්වා ඇති භෞතික වත්කම් අත්පත් කර ගැනීම්හි වටිනාකම (රු. 1,030,899) නිවැරදි බවත් ආකෘතිය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම, භෞතික වත්කම් අත්පත් කර ගැනීම සහ හැකියා වර්ධනය යන වියදම් කාණ්ඩ 3 හිම එකතුවක් ලෙස (රු. 3,412,287) නිවැරදිව දක්වා ඇති බවත් සඳහන් කරමි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ භෞතික වත්කම් අත්පත්කර ගැනීම් පමණක් දැක්විය යුතු වීම. |

**1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **ඇප ලේඛනය**<br>මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලැබුණු වහාම ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වීම. |

| | | |
|---|---|---|
| (ආ) **විදුලි උපකරණ පිළිබඳ ලේඛනය**<br>මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | 2020.12.31 දිනට ශේෂයන් 2021 ආරම්භක ශේෂයන් ලෙස ගෙන ලේඛනගත කරමින් විදුලි උපකරණ ලේඛනයක් පවත්වාගෙන යාමට අදාල නිලධාරින්ට උපදෙස් ලබා දෙන ලදී. | මුදල් රෙගුලාසි 454(2) හි සඳහන් පරිදි රජයේ ගොඩනැගිලිවල සියළුම විදුලි උපාංග හා උපකරණ පිළිබඳ බඩු ලේඛන පොතක් පවත්වා ගත යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණ සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණක තනතුරු පුරප්පාඩුව පැවතීම හේතුවෙන් මෙතෙක් අදාළ සමාලෝචන සිදු කර ගැනීමට නොහැකි වී ඇති බව සඳහන් කරන අතර එම තනතුර සඳහා නිලධාරියෙකු පත් කර ගැනීමෙන් අනතුරුව 2021 වර්ෂයේ සිට අදාළ සමාලෝචන සිදු කර, අභ්‍යන්තර පාලනය ශක්තිමත් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කරන බව සඳහන් කරමි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | <br>අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා ලිපි** | | | |
| (i) 2012 මැයි 21 දිනැති අංක EST/8/EXAMS/05/1007-1 ලිපිය | කථන හා ලිඛිත පරීක්ෂණ සඳහා අර්ධකාලීන පදනම මත බඳවාගත් නිලධාරීන්ට හා සම්පත් දායකයන්ට දීමනා ගෙවීමට අනුමැතිය ලබා දී තිබුණද, දෙමළ භාෂා කථන හා ලිඛිත පරීක්ෂණ පැවැත්වීම හා භාෂා පුහුණු පාඨමාලා සඳහා සිසුන් ලියාපදිංචි කිරීම වෙනුවෙන් ආයතනයේ පූර්ණකාලීන සේවය කරන නිලධාරීන් හට අනුමැතියකින් තොරව එලෙස රු.793,170 ක දීමනාව ගෙවා තිබුණි. | උපදේශකවරු හා පරීක්ෂකවරු සඳහා පුහුණු වැඩසටහන් හා දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ පැවැත්වීමේ රාජකාරි කටයුතු ද දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් ඉටු කරනු ලබයි | කථන හා ලිඛිත පරීක්ෂණ පැවැත්වීම හා පුහුණු පාඨමාලාවල රාජකාරි සඳහා සහභාගි වන පූර්ණකාලීන නිලධාරීන්ට ගෙවීම් කිරීම සඳහා ගෙවීම් ක්‍රමවේදය අනුමත කරගත යුතු වීම. |
| (ii) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛයේ 6 ඡේදය | දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම වසරකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවන් මානව සම්පත් සංවර්ධන සැලැස්ම තුළ සහතික විය යුතු වුවද, 2020 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබුණි. | 2020 වර්ෂයේදී අංශ ප්‍රධානියාගේ නිර්දේශ මත ලැබෙන ඉල්ලීම අනුව පුහුණු සඳහා යොමු කර ඇත. 2021 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කර ඇත. | සෑම නිලධාරියකුටම වසරකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවන් සහිතව මානව සංවර්ධන සැලැස්මක් සකස් කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2016 මාර්තු 31 දිනැති අංක 5/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1.6 ඡේදය | 2020 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2021 මාර්තු 31 දින දක්වාම විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2020 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයට අදාළ භෞතික සමීක්ෂණ කටයුතු මේ වන වට අවසන් කර ඇති අතර අපහරණ කටයුතු අවසන් කල විගස අදාළ වාර්තා විගණකාධිපති වෙත යොමු කල හැකි බව සඳහන් කරමි. පසුගිය දිනවල රට තුල පැවති කෝවිඩ් 19 වෛරස තත්ත්වය හේතුවෙන් කාර්යාල කටයුතු හා කාර්ය මණ්ඩලය සීමා කිරිමට සිදු වීම නිසා මෙම ප්‍රමාදයන් සිදුව ඇති බව වැඩි දුරටත් සඳහන් කරමි. | මාර්තු 30 දින වන විට පෙර වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ලබා දිය යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) නිසි අලෙවි පුරෝකථනයකින් තොරව 2016 හා 2017 වර්ෂවලදි මුද්‍රණය කරන ලද වටිනාකම රු. 15,262,050 ක්වූ පොත් 60,576 කින් වටිනාකම රු. 10,529,501 ක්වූ පොත් 47,667 ක් 2020 දෙසැම්බර් 31 දිනටද ඉතිරිව තිබුණි. ඉතා මන්දගාමිව අලෙවි වන මෙම පොත් මුද්‍රණය කිරිමේ වියදම අනාර්ථික වැය බරක් වී තිබුණි. | 2015, 2016, 2017 වර්ෂයන්හි දෙවන භාෂාව පිළිබඳ රාජ්‍ය සේවයේ නිලධාරීන්ට තිබූ භාෂා ප්‍රවීණතා සහ විභාග අවශ්‍යතා මත පදනම්ව මෙමපොත් මුද්‍රණය කර ඇත.<br><br>(i) ඒකක පිරිවැය අවම වීම සඳහා විශාල පිටපත් ප්‍රමාණයක් මුද්‍රණය කර ඇත.<br>(ii) E-Books ලෙස පරිශීලනය වීම නිසා පොත් අලෙවියට ඍජු බලපෑමක් සිදු කරයි. දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන, කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය වැනි අවස්ථාවලදී අලෙවි කුටි පවත්වාගෙන යාමට 2018-2020 වර්ෂවලදී කටයුතු කරන ලදි. | පොත් මුද්‍රණයේදි නිසි අලෙවි පුරෝකථනයකින් සිදු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | ඉහත කරණු අනුව, පොත් මුද්‍රණය සඳහා යෙද වූ මුදල් අනවශ්‍ය මුදල් වැය කිරීමක් ලෙස සැලකිය නොහැකි බව කාරුණිකව සඳහන් කරමි. | |
| (ආ) | භාෂා විද්‍යාගාරයට පරික්ෂණ මෘදුකාංගයක් නිර්මාණය කිරිම සඳහා රු.975,500ක් වූ ගිවිසුමකට 2018 වර්ෂයේ දෙසැම්බර් මාසයේදී එළඹ තිබුණි. ගිවිසුමට ඇතුළත් වූ වර්ෂයේදී මෘදුකාංගය භාවිතයට නොගැනීම නිසා නොමිලේ ලබාගත හැකිව තිබූ නඩත්තු සේවාව මගහැරී ගොස් තිබූ අතර මේ දක්වා විභාග කටයුතු සඳහා භාවිතයට ගැනීමට සුදුසු තත්ත්වයට පත් කර නොතිබුණි. | මේ වන විට පූර්ව පරීක්ෂණ සිදු කොට අවසන්ය. ඒ සඳහා විධිමත් ලෙස පැවැත් වූ එක් පරීක්ෂණයක් හා භාෂා විද්‍යාගාරයේ සිසුන් උපයෝගී කොටගෙන කරන ලද පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණ සඳහා ඉදිරිපත් වූ උසස් පුහුණු පාඨමාලාලාභීන්ගේ පරීක්ෂණ මෙම මෘදුකාංගය ඔස්සේ ක්‍රියාත්මක විය. | මෘදුකාංගයෙන් අපේක්ෂිත අරමුණ ඉටුකර ගත යුතු අතර එය නියමිත කාලවලදී ප්‍රයෝජනයට ගෙන නොමිලේ ලබා ගත හැකි නඩත්තු සේවාවද ලබාගත යුතු බව. |

## 3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කර නොතිබුණි. | එම වාර්තාව මේ වන විට සකස් කරමින් පවතින අතර කඩිනමින් එම කටයුතු අවසන් කර ඉදිරිපත් කරන ලෙස අදාළ නිලධාරින් වෙත උපදෙස් ලබා දෙන ලදී. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතු වීම. |

## 3.3 කළමනාකරණ දූර්වලතා

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 හා 2016 වර්ෂවලදි සිංහල, දෙමළ පරිවර්තක මෘදුකාංගයක් සකස් කිරිම වෙනුවෙන් රු. 4,860,000 ක්ද 2017 හා 2018 වර්ෂවලදි දෙමළ, සිංහල පරිවර්තන මෘදුකාංගයක් සකස් කිරිම වෙනුවෙන් රු.5,950,000 ක් වැය | භාෂා පරිවර්තන අංශය විසින් සිංහල - දෙමළ සහ දෙමළ - සිංහල පරිවර්තන මෘදුකාංගය භාවිත කරමින් දෛනික භාෂා පරිවර්තන කටයුතු සිදු කරන බව සඳහන් කරමි. තවද කිසිදු භාෂා පරිවර්තන මෘදුකාංගයකින් 100% ක් නිවැරදි පරිවර්තනයක් ලැබිය නොහැකි බැවින් මෘදුකාංගය මඟින් පරිවර්තිත | සිංහල භාෂාව දෙමළ භාෂාවටද, දෙමළ භාෂාව සිංහලට භාෂාවටද පරිවර්තනය කිරිමේ මෘදුකාංගය භාවිතා කිරිමට අවශ්‍ය කටයුතු සකස් කළ යුතු වීම. |

| | |
|---|---|
| කර තිබුණද, මේ දක්වා අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමට නොහැකි වී තිබුණි. | ලේඛනවල නිරවද්‍යතාව භාෂා පරිවර්තකයෙකු විසින් නැවත පරීක්ෂා කිරීමක් සිදු කරන බවද සඳහන් කරමි. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 2 ක්, තෘතියික මට්ටමේ තනතුරු 35 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 02 ක් පුරප්පාඩුව පැවති අතර සමාලෝචිත වර්ෂය තුළදී ද එකී පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි. | කොමසාරිස් තනතුර පවතින දෙපාර්තමේන්තුගත තත්ත්වයෙන් ඉවත් කර පරිපාලන සේවයේ තනතුරක් ලෙස ඇති කිරීමට අනුමැතිය ඉල්ලා ඇත. සහකාර කොමසාරිස් තනතුර සඳහා බඳවා ගැනීමේ පටිපාටිය සකස් කිරීම ආරම්භ කර ඇත. තෘතියික මට්ටමේ හා ප්‍රාථමික මට්ටමේ තනතුරු පිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. | අත්‍යවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු බව හා අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා බඳවා නොගත යුතු වීම. |
| (ආ) ද්විතියික මට්ටමේ තනතුරුවල අතිරික්ත සේවක සංඛ්‍යාව 20 ක් විය. | දෙපාර්තමේන්තුගත තනතුරු දරන නිලධාරීන් සංවර්ධන නිලධාරි සේවයට අනුයුක්ත වීම නිසා ඇති වූ තත්ත්වයකි. මෙම පිරිස් වෙනත් ආයතන වෙත අනුයුක්ත කරන ලෙස දැනටමත් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දී ඇත. | අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා බඳවා නොගත යුතු වීම. |
| (ඇ) 1999 වර්ෂයේ සිට භාෂා පරිවර්තක සහකාර ලෙස සේවයට බඳවාගෙන ඇති නිලධාරීන් 42 දෙනෙකු පලාත් පාලන ආයතන හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල සේවය සඳහා මුදාහැර තිබුණි. 2020 වර්ෂය සඳහා මෙම නිලධාරීන්ට රු. 25,410,440 ක වැටුප් හා දීමනා ලබා දී තිබුණ ද, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් කාර්ය පැවරුම් සිදුකර දෙපාර්තමේන්තුවට සේවාවක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | මෙම නිලධාරීන්ට මාසික හෝ වාර්ෂික වශයෙන් කාර්යය පැවරුමක් සිදු කර නොමැති අතර එකී නිලධාරීන්ගේ සේවය ඍජුව දෙපාර්තමේන්තුව වෙත නොලැබුනද භාෂා පරිවර්තකවරුන් ලෙස ඔවුන්ගේ සේවය මහජනයා වෙත ලබා දී ඇත.<br>මෙම නිලධාරීන්ගේ සේවය තවදුරටත් එම ආයතන වෙත අවශ්‍යද යන්න එම ආයතන ප්‍රධානීන්ගෙන් විමසා ඇති අතර ඒ අනුව මෙම නිලධාරීන් වෙනත් ආයතන වෙත අනුයුක්ත කරන්නේද දෙපාර්තමේන්තුව වෙත කැඳවන්නේද යන්න තීරණය කිරීමට කටයුතු යොදා ඇත. | සේවයට බඳවාගෙන ඇති නිලධාරීන් හට කාර්ය පැවරුම් සිදුකර දෙපාර්තමේන්තුවට සේවාවක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතු වීම. |